පා.ප්‍ර.මා. අංක *2013/271* - 2 වැනි කාණ්ඩය - XIII - රාජ්‍ය සංස්ථා - විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2011
-----------------------------------------------------------------------------------------------------------------------------------------------

**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය- 2011**

**------------------------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්වාගණනය කළ මතය**

**----------------------------**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මදල් ප්‍රවාහ ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය සතු ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීම වෙනුවට 2011 වර්ෂයේ ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ වියදම් රු. 8,935,413ක් පමණක් ජංගම නොවන වත්කම් යටතේ කළ වැඩ ගිණුම් දක්වා තිබුණි.

(ආ) කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කළද එය පරීක්ෂා කිරීමට අදාල ලෙජර ගිණුම් හා ඊට අදාල කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූයෙන් රු:20,104,311 ක ගිණුම්කරණ අඩුපාඩු ඇතුළත් කර 2012 සැප්තැම්බර් 28 දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. එම වාර්තාව පදනම් කරගෙන 2012 නොවැම්බර් 30 දින මා සමග පැවති සාකච්ඡාවේදී එම මූල්‍ය ප්‍රකාශන ඉල්ලා අස්කරගෙන 2013 පෙබරවාරි 26 වන දින රු:16,247,592 ක ගිණුම්කරන අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. තව දුරටත් රු.3,856,719 ක ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය වූයෙන් පරීක්ෂා කළ නියැදියෙන් බාහිරව තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේදී බැහැර කල නොහැක.

### 1.2.2. නොසැසඳෙන පාලන ගිණුම්

------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු නිෂ්පාදන ගිණුම සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන අමු ද්‍රව්‍ය තොගයේ වටිනාකම පිලිවෙළින් රු.1,415,352 ක් හා රු.1,337,932 ක් වුවත් සමීක්ෂණ වාර්තා අනුව ශේෂ පිලිවෙළින් රු.1,428,170 ක් හා 1,205,808ක් වූයෙන් වෙනස පිලිවෙළින් 12,818 ක් හා 132,124 ක් විය.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | විස්තරය |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන කොටසේ 99 වන වගන්තිය හා 2008 ඔක්තෝබර් 16 දිනැති කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 24 වන වගන්තිය | අධ්‍යයන ආයතනය විසින් අරමුදලක් පිහිටවිය යුතු වුවත් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි 371 | 2011 වර්ෂයේ සෙවනගල සීනි කර්මාන්තශාලාවට ලබා දී ඇති රු.228,275 ක අත්තිකාරම් මුදලක් 2013 මාර්තු 30 දින වන විටත් පියවා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.5,027,563 ක ඌණතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සහ නඩත්තු වියදම් සඳහා

රු.7,000,000ක් වු රජයේ පදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,972,439 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

ආයතනය ආරම්භයේදී දකුණු පළාත් ඉඩම් කොමසාරිස්වරයාගෙන් දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ලබාගෙන තිබූ දැනට ආයතනය පවත්වාගෙන යන ඉඩම් හා ගොඩනැගිලි සඳහා අදාල බදු මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර එම වත්කම් නීත්‍යානුකූලව ආයතනය වෙත පවරා ගැනීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.2 අරමුදල් ඌන උපයෝජනය හා හර ශේෂ**

----------------------------------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ**

(අ) 2011 වර්ෂයට පෙර පර්යේෂණ දෙකක් සඳහා ආයතනයට ලැබී තිබුණු රු:2,621,603 ක් වූ ප්‍රදානයන් අදාල කාර්යයන්ට භාවිතා නොකර වසර ගණනාවක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවයට (NAC)අදාල ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු.100,925 ක් වැය කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------

අංක PED/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වි දින 60 ක් ඇතුළත ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු බව දන්වා තිබියදී 2008 අර්ධ වර්ෂය ,2009 සහ 2010 වර්ෂ වලට අදාලව ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2013 පෙබරවාරි 26 වන දිනය.

## 4.2 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දින දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පීඊඩී 12 හි 5.1 ඡේදයට අනුව ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා ඵලදායීව යොදාගැනීමට හා මගපෙන්වීමට හැකිවනු පිණිස සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ නිසා 2011 වර්ෂයේදී ළඟාකර ගැනීමට / ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්ථ හා ඉලක්ක මොනවාද යන වග හා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 4.3 අභ්‍යන්තර විගණනය

---------------------

කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන කටයුතු සිදුකළ යුතු වුවත් , විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කර තිබූ විගණන වැඩසටහන සකස් කිරීමේදී මෙම ආයතනයේ විගණන කටයුතු ඇතුළත් කර නොතිබුණි.

## 4.4 විගණන කමිටු

----------------

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 චක්‍රලේඛයෙහි 7.4.1. ප්‍රකාර ආයතනය වෙනුවෙන් විගනණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

## 4.5 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

රාජ්‍ය ව්‍යවසාය සඳහා වු මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියල කර නොතිබුණි.

## 4.6 අයවැය පාලනය

-----------------

ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛණය විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අයවැය ලේඛණය ඵලදායී මුල්‍ය පාලන කාරකයක් වශයෙන් යොදාගත් බවට විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

## 4.7 කෙටුම්පත් වාර්ෂික වාර්තාව

-----------------------------

රාජ්‍ය ව්‍යවසාය සඳහා වු මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.1 ඡේදය ප්‍රකාර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) අත්තිකාරම්

(ආ) ගිණුම්තැබීම

(ඇ) ගබඩා පාලනය

(ඈ) ඉන්වෙන්ට්‍රි නඩත්තු කිරීම

(ඉ) අභ්‍යන්තර විගණනය